සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	6 ශ්‍රේණිය	පුරවැසි අධ්‍යාපනය I - II	කාලය / நேரம் / Time	පැය 02යි

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

I කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. සැලසුම් සහගත ශිෂ්‍යයා සතු ලක්ෂණයක් වන්නේ,
   (1) ආතතියෙන් යුතුව වැඩකටයුතුවල යෙදෙයි.
   (2) වැඩ කල් දමයි.
   (3) තම අරමුණු ඉටු කර ගනියි.
   (4) අභියෝගවලට මුහුණ දීම අපහසු වේ.

2. විනය හා ශික්ෂණය සඳහා ප්‍රගුණ කරගත යුතු ගුණාංගයක් නොවන්නේ,
   (1) අවංක බව
   (2) යුක්තිගරුක නොවීම.
   (3) ඉවසීම.
   (4) මිත්‍රශීලී බව

3. ශ්‍රී ලංකාවේ මුල්ම අධ්‍යාපන අමාත්‍යවරයා කවුරුන්ද?
   (1) ඩී. එස්. සේනානායක මහතා
   (2) එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා
   (3) විලියම් ගොපල්ලව මහතා
   (4) ආචාර්ය සී. ඩබ්. ඩබ්. කන්නංගර මහතා

4. නීතිය යනුවෙන් අදහස් වන්නේ,
   (1) පුද්ගලයන්ගේ බාහිර හැසිරීම් පාලනය කිරීමට රජය විසින් පනවා ඇති කොන්දේසි වේ.
   (2) අතීතයේ සිට නැවත පැවත එන සමාජ සම්මතයන් වේ.
   (3) නොකළ යුතු බවට සම්මතයේ ඇති කොන්දේසි වේ.
   (4) අප විසින් අනුගමනය කළ යුතු දේවල් වේ.

5. සමාජයේ ක්‍රියාත්මක වන සරු දෙයකි,
   (1) අන්ධ භක්තියෙන් කටයුතු කිරීම.
   (2) නොගැළපෙන මිතුරන් ඇසුරු කිරීම.
   (3) අධ්‍යාපනයේ යෙදීම.
   (4) සංස්කෘතියට නොගැළපෙන විලාසිතා භාවිතය.

Past Papers Wiki

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල 'A' තීරුව හා 'B' තීරුව ගළපා යා කරන්න.

'A' තීරුව	'B' තීරුව
6. සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම.	භූමිය
7. "නිර්මිත පරිසරයට" අයත් වේ.	බණිජ
8. කෘෂිකර්මාන්තය සඳහා යොදා ගනී.	ජලය
9. ස්වභාවික සම්පතකි.	ප්‍රතිචක්‍රීකරණය
10. කර්මාන්ත හා ප්‍රවාහනයට යොදා ගනී.	නෙළුම් පොකුණ

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට හරි නම් (√) ලකුණ ද, වැරදි නම් (x) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

11. සියලුම පුරවැසියන්ට පොදුවේ ප්‍රයෝජනයට ගත හැකි ලාභ අපේක්ෂාවෙන් තොරව රජය විසින් සපයන දේ පොදු දේපළ වේ. ( )
12. ඖෂධවේදය පිළිබඳ මෙරට ප්‍රථම මහාචාර්යවරයා වන්නේ සේනක බිබිලේ මහතා ය. ( )
13. අනුරාධපුරයේ කලා වැව සමීපයේ පිහිටා ඇති විශිෂ්ට කලා නිර්මාණය සමාධි පිළිමයයි. ( )
14. පාසල අනාගතයේ දී ඉටු කර ගැනීමට බලාපොරොත්තු වන අරමුණ "දැක්ම" තුළින් ප්‍රකාශ වේ. ( )
15. පුත්තලම හා කුරුණෑගල දිස්ත්‍රික්ක ඌව පළාතට අයත් වේ. ( )

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට වරහන තුළ දී ඇති වචනවලින් සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

16. අවධානයෙන් හා අවබෝධයෙන් යුතුව අසා සිටීම ..... සවන්දීම වේ.
17. පාසලෙන් ජාතියට සිදුවන මෙහෙය වඩාත් හොඳින් සිසු හදවත් තුළ ජනිත කරවීමට සමත් වන්නේ ..... යි.
18. දෙපාර්තමේන්තු නීති රීති පාසල් තුළ ක්‍රියාවට නංවනුයේ ..... විසිනි.
19. පාසල හා සම්බන්ධ විශේෂ මානව සම්පතක් ලෙස ..... හැඳින්විය හැකිය.
20. සිසුන්ගේ සෞඛ්‍ය පරීක්ෂාව, එන්නත් ලබාදීමේ වැඩසටහන්, උස, බර, BMI අගය පරීක්ෂා කිරීම ..... විසින් සිදු කරනු ලබයි.

(හෙදියන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, සක්‍රීයව, පාසල් ගීතය, මෙහෙවර, ගුරුවරුන්, විදුහල්පතිවරුන්, අංශ ප්‍රධානීන්)

(ලකුණු 2x20=40)

Past Papers Wiki

II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.**
- තෝරාගත් තවත් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතුය.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි.**

---

1) i. පාසලේ ඉතිහාසය පිළිබඳ තොරතුරු සොයා ගැනීමට උපකාරී වන මූලාශ්‍ර දෙකක් සඳහන් කරන්න. (ල. 02)

ii. පාසලක ප්‍රධානියා ලෙස විදුහල්පතිවරයාගෙන් ඉටුවිය යුතු කාර්යයන් දෙකක් ලියන්න. (ල. 02)

iii. a). ඔබේ පාසලේ "දැක්ම" සඳහන් කරන්න.

b). ඔබේ පාසලේ "ආදර්ශ පාඨය" සඳහන් කරන්න. (ල. 02)

iv. පාසල් ශිෂ්‍යයකු ලෙස ඔබ තුළ පවත්නා දක්ෂතා දෙකක් හා දුර්වලතා දෙකක් ලියා දක්වන්න.

- දක්ෂතා 1. ……..……..
  2. ……..
- දුර්වලතා 1. ……..……..
  2. ……..

(ල. 02)

v. පහත සඳහන් ජීව දත්ත තොරතුරු සම්පූර්ණ කරන්න.

1. ඔබගේ සම්පූර්ණ නම:	……..……..
2. උපන්දිනය :	……..……..
3. පෞද්ගලික ලිපිනය:	……..……..
4. ඔබේ පාසලේ නම:	……..……..
5. පාසලේ ලිපිනය :	……..……..
6. පාසලට ඇතුළත් වූ දිනය:	……..……..

(ල. 04)

2) i. පාසලේ සාමාජිකයකු ලෙස ඔබ සතු අයිතිවාසිකම් තුනක් හා ඒ වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම් තුනක් ලියන්න.


අයිතිවාසිකම්	යුතුකම්
1. ……..……..	1. ……..……..
2. ……..……..	2. ……..……..
3. ……..……..	3. ……..……..

(ල. 06)

ii. ඔබේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමට සහ හැකියා වර්ධනය කර ගැනීමට රජය විසින් සපයා ඇති පහසුකම් තුනක් ලියන්න. (ල. 03)

iii. ගුරු මණ්ඩලය වෙනුවෙන් ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් තුනක් සඳහන් කරන්න. (ල. 03)

3)



i. ඉහත ඉංග්‍රීසි අක්ෂර යටතේ දක්වා ඇති පරිපාලන ඒකක නම් කරන්න.

A. ……..……

B. ……..……

C. ……..……

D. ……..…… (ල. 04)

ii. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ඉටු කරගත හැකි සේවාවන් දෙකක් ලියන්න. (ල. 02)

iii. සේවා සපයන ආයතනයකින් සේවා ලබා ගැනීමේ දී අප විසින් ඉටු කළ යුතු යුතුකම් තුනක් ලියන්න. (ල. 06)

4) i. භෞතික සම්පත් බෙදෙන ප්‍රධාන කොටස් දෙක සඳහන් කරන්න.



1. ..... 2. ..... (ල. 02)

ii. ඔබ ප්‍රදේශයේ දක්නට ලැබෙන ප්‍රධාන භෞතික සම්පත් හතරක් ලියා ඒවායින් ලැබෙන ප්‍රයෝජන එක බැගින් ලියන්න. (ල. 04)

iii. භෞතික සම්පත් සංරක්ෂණයට ගත හැකි ක්‍රියාමාර්ග තුනක් උදාහරණ සහිතව සඳහන් කරන්න. (ල. 06)

5) i. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන වර්ග තුන සඳහන් කරන්න. (ල. 03)

ii. එම ආයතනවල ප්‍රධානීන් තිදෙනා නම් කරන්න. (ල. 03)

iii. පළාත් පාලන ආයතනවලින් සිදුවන සේවාවන් හයක් ලියා දක්වන්න. (ල. 06)

6) i. ඇනුම් පද නොකියමි
බැනුම් කැත බස් නොකියමි
නිකම් බස් නොකියමි
තරම් පමණට වදන් තෙපලමි

a). මෙම කවිය සඳහන් ග්‍රන්ථය කුමක්ද? (ල. 02)

b). එම ග්‍රන්ථයේ කතුවරයා කවුරුන්ද? (ල. 02)

ii. මෙම කවියෙන් කියවෙන ආචාරශීලී කථනයේ පැවතිය යුතු අංග ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 04)

iii. ආචාරශීලී ලෙස භාෂාව භාවිතයෙන් ලැබෙන යහපත් ප්‍රතිඵල දෙකක් හා අයහපත් ප්‍රතිඵල දෙකක් සඳහන් කරන්න. (ල. 04)

7) i. a). දේශීය සම්පත් දෙකක් ලියන්න.

b). දේශීය නිෂ්පාදන දෙකක් ලියන්න. (ල. 02)

ii. පහත වගුව සම්පූර්ණ කරන්න.

පරිසර අංග	දූෂණයට හේතු
1.	1. ..... 2. .....
2.	1. ..... 2. .....
3.	1. ..... 2. .....

(ල. 06)

iii. යහපත් පුරවැසියෙකු ලෙස පරිසරය සුරැකීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග හතරක් ලියන්න. (ල. 04)

PAST PAPERS WIKI
WWW.PastPapersWiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank